**කොලොන්න ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 27 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2013 අගෝස්තු 07 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරම් අනුව, කොලොන්න ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කොලොන්න ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබද තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සදහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

(අ) ගබඩා ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු 617,257 ක වියදමක් දරා ඇති නමුත් මෙම අගය ගබඩා ලෙජර් ගිණුමට හර කර පාවිච්චි කරන ලද ද්‍රව්‍ය වියදම් කළ වැය ශිර්ෂ අනුව සටහන් කර නොතිබුණි.

(ආ) ගිණුම් විෂයයන් 11 කට අදාලව ලෙජර් ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු 2,900,996 ක් වූ අතර උපයෝගී ලේඛන හා වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු 1,817,077 ක් විය. එම වෙනසට හේතු සොයා බලා ලෙජර් ගිණුම් වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

**1.3.2 විගණනය සදහා සාක්ෂි නොවීම.**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු 8,831,503 ක ගනුදෙනු විගණනයේදී ද සතුටුදායක ලෙස නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 2,234,240 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 2,850,151 ක් විය

**2.2 ආදායම් පරිපාලනය.**

**2.2.1 ඇස්තමේන්තු ගත ආදායම් තථ්‍ය ආදායම් හා හිග ආදායම්.**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් හා හිග ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිගය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | බදු කුලී | 535 | 560 | 7 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 172 | 183 | 1 |
| (iii) | වෙනත් ආදායම් | 5420 | 2117 | 49 |

### 2.2.2 ජල ගාස්තු

(අ) කොලොන්න ජල ව්‍යාපෘතියේ 2012 වර්ෂයේ මුළු පාරිභෝගික සංඛ්‍යාව 112 ක් සඳහා එක් අයෙකුගේ මාසික ගාස්තුව රු 100 බැගින් වර්ෂයකට ඇස්තමේන්තුගත ආදායම රු 134,300 ක් වුවද බිල්කළ ආදායම රු 87,200 ක් වූයෙන් වර්ෂයේ ආදායම රු 47,100 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) බුලු තොට ජල ව්‍යාපෘතියේ මුළු පාරිභෝගික සංඛ්‍යාව 94ක් වන අතර මාසික අවම ගාස්තුව මත වර්ෂයට අයවිය යුතු ගාස්තුව මනු කියවීම් ගාස්තු හැර රු 229,200 ක් විය. ව්‍යාපෘතියේ වර්ෂයේ බිල් කිරීම් රු 152,720 ක් වූයෙන් වර්ෂයේ නියමිත ආදායම වර්ෂයේ බිල් කිරීම් සඳහා ගණනය වී නොමැති බව අනාවරණය විය.

### 2 .2 .3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 916,125 |
| (ii) මුද්දර ගාස්තු | 7,166,160 |

### 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානයට යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය